**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 19/93**

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1993 සැප්තැම්බර් මස 06 වෙනි දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

<u>ලිපිකරු හා සමාන්තර සේවා වල විෂමතා නැති කිරීම</u>

ඒකාබද්ධ සේවයට අයත් ලිපිකරු සහ සමාන්තර සේවා වලින් 11 "ආ' පන්තිය, 11 "අ" පන්තිය, 1 වෙනි පන්තිය, අධි ශ්‍රේණිය වශයෙන් උසස්වීම් ක්‍රමයක් නොමැති, පොත් තබන්නා සේවය, සරප් සේවය හා ගබඩා භාරකාර සේවය සඳහා එවැනි සමාන්තර ක්‍රමයක් ඇති කිරීමට රජය තීරණය කර ඇත. මෙසේ ඇති කරනු ලබන නව අධි ශ්‍රේණියට රා.පරි. චක්‍රලේඛ 37/92 යටතේ එස්-3-5 වැටුප් ක්‍රමය අදළ වනු ඇත.

02. ලඝුලේඛක සේවයේ දැනට පවත්නා ශ්‍රේණි ක්‍රමය සහ ඊට අදළ වැටුප් පරිමාණ නොවෙනස්ව ක්‍රියාත්මක වනු ඇත. ලඝුලේඛක සේවයට බඳවා ගැනීම සඳහා වන සුදුසුකම් අ.පො.ස. (උසස් පෙළ) හෝ ඊට සමාන සුදුසුකමක් දක්වා ඉහළ දමනු ලැබේ.

03. ඒකාබද්ධ සේවයට අයත් ලිපිකරු හා සමාන්තර සේවාවල නිලධාරීන් අධි ශ්‍රේණියට උසස් කිරීමේදී ජ්‍යෙෂ්ඨත්වය / කුසලතාව මත පුරප්පාඩු වලින් 65% ක් ද, සීමිත තරඟ විභාග ප්‍රතිඵල මත 35% ක් ද වශයෙන් පොදු අනුපාත ක්‍රමයක් ඇති කරනු ලැබේ. මෙම කරුණ සම්බන්ධව ලිපිකරු හා සමාන්තර සේවා යනුවෙන් පහත සඳහන් සේවාවන් අදහස් වේ.

(I) සාමාන්‍ය ලිපිකාර සේවය
(II) යතුරු ලේඛක සේවය
(III) ලඝුලේඛක සේවය
(IV) පොත් තබන්නා සේවය
(V) සරප් සේවය
(VI) ගබඩා භාරකාර සේවය

04. 1992.01.10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/92 හි සඳහන් කොන්දේසි වලට යටත්ව, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 387 හි සඳහන් ආර්-3-8 වැටුප් පරිමාණය දුම්රිය ලිපිකරු සේවයේ සහ මුද්‍රණ ලිපිකරු සේවයේ අධි ශ්‍රේණියට අදළ කෙරෙනු ඇත.

05. දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ ද 1993 ජුලි 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධි ශ්‍රේණියක් ඇති කරනු ලබන අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 37/92 හි සඳහන් එස්-3-8 වැටුප් පරිමාණය එයට අදළ කෙරෙනු ඇත.

අ.කලේ/එම්.ඩී.ඩී. පීරිස්
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය